# 2.16 දඹදෙණි යුගයේ පැවති උපුල්වන් දේව වන්දනය හා අලුත් නුවර දේවාලය ඉදිවීමේ පුවත

ජේ. එම්. සුධර්මාවතී
ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

ලක්දිව ප්‍රධාන රජධානි අතර තුන්වන රාජධානිය වුයේ දඹදෙණියයි. පොළොන්නරු රාජධානිය බිඳවැටීමෙහිලා බලපෑ සාධක අතර ආසන්න ම හේතුව වුයේ දකුණු ඉන්දියානු ප්‍රදේශයක් වු කාලිංගයේ සිට පැමිණි මාඝ නමැත්තාගේ නායකත්වයෙන් මෙහෙයවුණ ආක්‍රමණයයි. මේ ආක්‍රමණයේ ප්‍රතිඵලය වුයේ පොළොන්නරුව පාලන මධ්‍යස්ථානය බිඳ වැටීම හා ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ පරිහානිය උදා වීමයි.

පැවැතුණ මෙම තත්ත්වයට අභියෝග කරමින් මායා රට කේන්ද්‍ර කරගෙන බිහි වු දේශපාලන එක්සත්කමේ ප්‍රතිඵලය වුයේ III විජයබාහු රජතුමා විසින් දඹදෙණිය රාජධානියක් ලෙස පිහිටුවා ගැනීමයි. එතුමාගේ අනුප්‍රාප්තිකයා වුයේ II පරාක්‍රමබාහු රජතුමාය. මෙම පර්යේෂණය හා බැඳී පවත්නා රාජ්‍ය අවධිය වන්නේ II පරාක්‍රමබාහු රාජ්‍ය සමයයි. දේශපාලනික බලයක් ගොඩනගා ගනිමින් විදේශ ආක්‍රමණයන්ට සාර්ථකව මුහුණ දීමට මොහු සමත් විය.

මේ රාජ්‍ය අවධියේ දී උපුල්වන් දේවා වන්දනය සම්බන්ධ විශේෂ තොරතුරු රැසක් අනාවරණය වේ. ඓතිහාසික දත්ත ඒකරාශි කිරීමේ ප්‍රධාන මුලාශ්‍රය වන්නේ ප්‍රාථමික මුලාශ්‍රයයි. වංසකථා සාහිත්‍යයේ සඳහන් නොවන බොහෝ තොරතුරු ලේඛනගත වු තවත් ප්‍රාථමික මුලාශ්‍රය රාශියක් පවතී. මෙම ලේඛන ආශ්‍රයෙන් වංසකථා සාධක තුළින් බොහෝදුරට හෙළිදරව් නොවන තොරතුරු හෙළිදරව් කරගනිමින් නිරවද්‍ය ඉතිහාසයක් ගොඩනැගීමට හැකියාව ලැබේ. අලුත් නුවර දේවාලය කිරීම පිළිබඳව එන ලේඛනය මෙහිදී ප්‍රධාන මුලාශ්‍රයක් ලෙස සැලකිය හැකි ය.

මෙම මුලාශ්‍රයේ එන තොරතුරු විශ්ලේෂණය කරමින් ප්‍රාථමික මුලාශ්‍රය පරිහරණය හා ස්ථානය පිළිබඳව කරනු ලැබු ක්ෂේත්‍ර ගවේෂණය තුළින් ප්‍රස්තුත අධ්‍යයන සිදු කර තිබේ.

මෙකල උපුල්වන් දේව වන්දනයේ ප්‍රධාන ස්ථානයක් ලෙස දෙවුන්දර දේවාලය සඳහන් කළ හැකි ය. දෙවුන්දර දේවාලයේ පැවැත් වු දේව වන්දනයේ ප්‍රතිඵලයක් ලෙස අලුත් නුවර දේවාලය ඉදිකිරිම සිදු වී තිබේ. ශ්‍රී ලංකාවේ ජනාවාසවීමේ පුවතේ සිට උපුල්වන් දෙවියන් සම්බන්ධව ද මුලාශ්‍රයගත සාක්ෂි ඇති උපුල්වන් දේව වන්දනය 13 වන සියවසේ බෙහෙවින් ජනප්‍රියව පැවති බව ද නිගමනය කළ හැකි ය.